# ශ්‍රී ලංකාවේ ඉතිහාස හා පුරාවිද්‍යා පර්යේෂණ ක්ෂේත්‍රයට එච්. ඩබ්. කොඩ්රිංටන්ගෙන් ලැබුණු දායකත්වය

**එම්.ඒ.එස්.ආර්. සංජීවී මන්ත්‍රීරත්න**[1]

කොඩ්රිංටන් බ්‍රිතාන්‍ය රාජ්‍ය නිළධාරියෙකු වශයෙන් ලංකාවේ සේවය කළේ (1903-1942) යුරෝපියයන් ප්‍රාචීන අධ්‍යාපන පිළිබඳ පර්යේෂණ සහ විමර්ශනය සඳහා තදබල උනන්දුවක් දැක්වූ අවධියකය.

මෙරට ශාස්ත්‍රීය පර්යේෂණ සඳහා තෝතැන්නක් වූ ආයතනයක් 1845 දී "ශ්‍රී ලංකාවේ රාජකීය ආසියාතික සමිතිය" නමින් ආරම්භ වීම මෙරට පර්යේෂණ ක්ෂේත්‍රයේ ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි. එමගින් මෙරට සිටි ඉංග්‍රීසි උගත් විද්වතුන්ට අදහස් හුවමාරු කරගැනීමට හැකි සාකච්ඡා මණ්ඩපයක් සකස් කෙරිණි. එච්.ඩබ්. කොඩ්රිංටන් ද ඒ සමිතියේ සිටි ජ්‍යෙෂ්ඨතම සාමාජිකයෙකි.

19 වන සියවසේ මැද භාගය වන විට පිරිවෙන් ක්ෂේත්‍රයේ ඇතිවූ වර්ධනය තුළින් මෙරට පැරණි පොත්පත් පරිශීලනය හරහා පාලි සංස්කෘත උගත් ගිහි පැවිදි පඬිවරු බොහොමයකගේ නව පිබිදීමක් ඇති වුණි. එමෙන්ම පන්සල් පොත්ගුල්වල සැඟව පැවති දැනුම මුද්‍රණ ද්වාරයෙන් ප්‍රකාශයට පත්කිරීම නිසා දේශීය අනන්‍යතාව එළි දක්වෙන ශාස්ත්‍රීය පර්යේෂණ ප්‍රකාශයට පත් වී තිබුණි. එමෙන්ම ඉංග්‍රීසි භාෂාවෙන් මූලික හා ද්විතීය අධ්‍යාපනය ලැබූ ශ්‍රී ලාංකික මධ්‍යම පාංතිකයින්ගෙන් පැවත ගෙන එන උගත් පිරිසක් ද මෙරට සිටියේය. ඒ උගතුන්ගෙන් සමහරකු සිය ඥාන සම්භාරය බටහිර ලෝකයා වෙත රැගෙන යාමේ කටයුතුවල නියැලුණු තැනැත්තෝය. ජේම්ස් ද අල්විස් නම් මධ්‍යම පාංතික ඉංග්‍රීසි උගතා දේශීය අනන්‍යතාව මතුකර ගැනීමට කටයුතු සිදුකළ පර්යේෂණ ආශ්‍රයෙන් එය තහවුරු වේ. එමෙන්ම 1890 වන විට මෙරට පුරාවිද්‍යා සමීක්ෂණය පිහිටුවීම තුළින් එතෙක්

[1] ඉතිහාස හා පුරාවිද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපු විශ්වවිද්‍යාලය
ඊමේල්: smanthrirathne@yahoo.com

අක්‍රමවත්ව සිදුවූ පුරාවිද්‍යා කටයුතු ඉංග්‍රීසි උගත් නිලධාරීන් විසින් ආරම්භ කර පවත්වාගෙන යෑමෙන් පැහැදිලි වන්නේ මෙරට පිළිබඳ දැනුම ගවේෂණයට ඔවුන් තුළ පැවති උනන්දුවයි.

19 වන සියවසේ අගභාගය දේශීය භාෂාව සංස්කෘතිය සහ ආගම පිළිබඳ උගතුන් අතර නිරන්තර ශාස්ත්‍රීය සංවාද ඇතිවන, ශාස්ත්‍රිය ආයතන බිහිවන හා ප්‍රකාශන නිකුත් වන ප්‍රබෝධමත් කාල පරිච්ඡේදයකි. එච්. ඩබ්ලිව්. කොඩ්රිංටන් ලංකාවේ විවිධ ප්‍රදේශ වල රාජකාරී කටයුතු වල යෙදෙන අතරම ලැබෙන ඉඩ ප්‍රස්ථාවෙන් ප්‍රයෝජන ගෙන මෙරට ඉතිහාසය හා පුරාවිද්‍යා විෂය ක්‍ෂෙත්‍ර පිළිබඳ ගවේශණ වල යෙදී තිබේ. අපට ඒවායේ ප්‍රතිඵල ශ්‍රී ලංකාවේ රාජකීය ආසියාතික සමිතියේ සඟරාවේ අඩංගු ලිපි වලින් දැකගත හැක. එපමණක් නොව එතුමා විසින රචිත අගනා ස්වාධින පර්යේෂණ කෘතින් කිහිපයක්ද ඇත.

මෙම පර්යේෂණ පත්‍රිකාවෙන් බලාපොරොත්තු වන්නේ එතුමාගේ එම පර්යේෂණ මෙරට ඉතිහාසය සහ පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ අභිවර්ධනය සඳහා කෙතරම් දුරට ඉවහල් වූයේද යන්න සොයා බැලීමයටය.

**ප්‍රමුඛ පද:** කොඩ්රිංටන්, පුරාවිද්‍යා පර්යේෂණ, රාජකීය ආසියාතික සමිතිය

**Title:** Codrington’s contribution to research in history and archaeology in Sri Lanka

**Keywords:** Codrington, archaeological research, Royal Asiatic Society